

# කුඹල් සකෙන් ඉපදෙන මැටි බඳුන්



එච්. ඩබ්ලිව් මෙත්මා ලෝසතී දසනායක

# කුඹල් සකෙන් ඉපදෙන මැටි බඳුන්

## එච්. ඩබ්ලිව් මෙත්මා ලෝසති දසනායක
කතෘ

කතෘගේ වෙනත් කෘති

කැදර වුබි රාළ
පුංචි මගේ සති පාසල

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
පන්තිය - 5 ශ්‍රේණිය ඒ
කෘතිය පළ කරන දිනය - 2026.06.14

ISBN අංකය: 978-624-211-167-4

මේ පොත ලියන්නට

මා දිරිගන්වන ලද

මහාමායාවේ ගරු විදුහල්පතිතුමිය

ඇතුළු

සියලු ගුරු මැණිවරුන් පියවරුන්

හා

මගේ ආදර දෙමාපියන්

වෙත

සෙනෙහසින් පුද කර සිටිමි



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# හැඳින්වීම



රන් කුඹලා කියන්නේ පොඩි මැටි පිඬකින් ගෙවල් සාදන ඉංජිනේරුවෙක් වගේ කෙනෙක් කියලා මට සිතුනා.

ඒ වගේම සකපෝරුවක් උඩ පොඩි මැටි පිඬක් කරකවා ලස්සන මැටි බඳුනිර්මාණය කරනවා. එහෙම හැදෙන ලස්සන මැටි බඳු ගැන හොයන්න මටත් පුංචි ආශාවක් දැනුනා. ඒ නිසාම මම පවුලේ අයත් එක්ක කෑගල්ල, මොළගොඩ ප්‍රදේශයේ මැටි භාණ්ඩ හදන ගම්මානයට ගියා.




## මා දැන ගත් ඉතිහාස කථාව

අතීතයේ මිනිසුන් ආහාර පිස ගැනීමට මැටි භාණ්ඩ යොදා ගෙන තියනවා. ඒ කාලේ මැටි පිඬක් අරගෙන විවිධ හැඩවලට සාදා අව්වේ වේලා ගින්නෙන් පුළුස්සාගෙන මැටි බඩු සාදාගෙන තියෙනවා.

සක පෝරුව ඊජිප්තුව කියන රටේ මුලින්ම හදලා තියෙන්නේ. ඒ රටේ මිනිස්සු එය දෙවියන්ගෙන් ලැබුණු තෑග්ගක් වගේ පිළිගෙන තියෙනවා.

## අපේ රටේ මැටි කර්මාන්තය දක්නට ලැබෙන ප්‍රදේශ

අපේ රටේ කෑගල්ල, ගම්පහ, ගාල්ල, මාතර ප්‍රදේශවල මැටි භාණ්ඩ වෙළඳසැල් ගොඩක් තිබෙන බව අම්මා මට කියලා දුන්නා.



## විවිධ මැටි භාණ්ඩ වර්ග

මම මොළගොඩ පිහිටි මැටි භාණ්ඩ වෙළඳසැල් කිහිපයකට ගිය අවස්ථාවේ ගොඩක් මැටි භාණ්ඩ දැක්කා. ඒ අතරින් එම භාණ්ඩ පහත සඳහන් පරිදි වර්ග කරන්න පුළුවන්.

- නිවෙස්වල භාවිතා කරන මැටි භාණ්ඩ




- ආගමික කටයුතු සඳහා භාවිතා කරන මැටි භාණ්ඩ




- ගොඩනැගිලි සඳහා භාවිතා කරන මැටි භාණ්ඩ




- සැරසිලි සඳහා භාවිතා කරන මැටි භාණ්ඩ





## මැටි භාණ්ඩ සාදන්න යොදා ගන්න මැටි වර්ග ගැන මා දැනගත් දේ...

අපේ රටේ මැටි බඩු හදන්න කිරි මැටි හා රතු මැටි යොදා ගන්නවා කියලා දැන ගන්න ලැබුණා. කිරි මැටි සුදු පාටයි. ඒවා කාලයත් එක්ක ශාක හා සත්ව කොටස් සමඟ මිශ්‍ර වෙලා රතු මැටි බවට පත් වෙනවා. ඒවා රතු පාටයි.

## මැටි භාණ්ඩ සෑදිම සඳහා යොදා ගන්නා උපකරණ...



❖ අත් සක පෝරුව

අතින් පමණක් කරකවමින් මැටි බඩු සාදයි.



❖ පා සක පෝරුව

පාදය මගින් තල්ලු කරන විට සක පෝරුව කරකැවෙන අතර ඒ හරහා මැටි බඩු සාදයි. මමත් ආශාවට පුංචි මැටි බඩුවක් හැදුවා.



❖ විදුලි සක පෝරුව

විදුලියෙන් සක පෝරුව කරකැවෙන අතර ඒ හරහා මැටි බඩු සාදයි.

## මැටි භාණ්ඩ සාදන ආකාරය ගැන නිරික්ෂණ හා අත්දැකීම් තුලින් මා දැන ගත් දේ...

- මම මොළගොඩ විසිතුරු මැටි බඩු හදන ස්ථානයකට ගියා. එතන විවිධ සක පෝරු වර්ග තිබුණා.

- එම ස්ථානයේ මැටි භාණ්ඩ සෑදීම සඳහා අවශ්‍ය ස්වභාවික මැටි කොළඹ, කඩුවෙල ප්‍රදේශයෙන් ගෙන්වන බවට දැනගැනීමට ලැබුණා.

- එම පස් ලොරියක් ගෙන්වීමට රුපියල් 50000 ක පමණ මුදලක් වැය වන බවත්, ඒ හරහා රුපියල් 500,000 කට ආසන්න ආදායමක් උපයා ගත හැකි බවට මට දැනගන්න ලැබුණා.

- එහෙම ගෙනෙන මැටි අව්වේ වේලා යන්ත්‍ර මගින් පදම් කරලා තමයි මැටි බඩු හදන්න කුඩා මැටි බෝල හදාගන්නේ.



- ඒ මැටි ගුලියකට වතුර ටිකක් දාලා අත්ල උඩ තියලා මහපට ඇඟිල්ලෙන් මැටි ගුලිය තෙරපා විවරයක් සාදා ගන්නවා. ඊට පස්සේ ඇඟිලි උදව් කරගෙන විවිධ හැඩවලට භාණ්ඩ නිර්මාණය කරන්න පුළුවන්.



- මෙලෙස සදන භාණ්ඩ මඳ පවනේ වියලීම සිදු කරනවා. අව්වේ තැබීම සුදුසු නැහැ.



- වේලෙන්න තිබූ භාණ්ඩ පැත්තෙන් පැත්ත හැරවීමෙන් දින තුනක් පමණ වියළා පිලිස්සීමට සූදානම් කරනවා. ඒ වගේ පිලිස්සීමට සූදානම් කළ භාණ්ඩ ගොඩක් මම ගිය ස්ථානයේ තිබුණා. ඒවා ටිකක් කළු පාට වෙලා තිබුණේ.



- ඉන්පසු මට ඒ භාණ්ඩ පුච්චන විධිය බලන්න ලොකු ආශාවක් ඇතිවුණා. පසුව මම භාණ්ඩ පිළිස්සීමට යොදා ගන්නා දර පෝරණුව ලගට ගියා.



• ඒ පෝරණුව මගේ උසට තිබුණා. එය ගඩොල් වලින් සකස් කර තිබූ අතර දර දැමීමට වා කවුළු 3ක් සකස් කර තිබුණා.

• පෝරණුව උඩ උළු කැට තිබුණා. ඒ උඩ වේළුණු මැටි වළං එක උඩ එක අසුරා ඒ අතරට කැඩුණු වළං කැලි දාලා තිබුණා.



• ඉන් පසුව ඒ වළං උඩින් පිදුරු දාලා ඒ උඩින් නැවත මැටි පස් දාලා වහනවා. අන්තිමට දරයි, පිදුරුයි දාලා ගින්දරේ පුළුස්සනවා මම දැක්කා.

• පිදුරු සුදු පාට වුණාම එම මැටි භාජන පිළිස්සී ඇතැයි කියලා දින 3කින් විතර එළියට අරගෙන ඒ භාණ්ඩ වල වර්ණ ආලේප කරන්න වෙනම තැනක අසුරනවා.

• එහෙම පිච්චුණු මැටි භාණ්ඩ තැඹිලි පාටක් ගන්නවා. ඒක මට හොඳ අත්දැකීමක් වුණා.



- ඇත්තටම මේ ගමනින් මම අළුත් දේවල් ගොඩක් ඉගෙන ගත්තා. ඒක මට හැමදාම මතක තියෙනවා.

## ලංකාවේ මැටි කර්මාන්තය ගැන පුංචි මගේ සිතුවිලි...

- ලංකාවේ මැටි කර්මාන්තයේ නියැලෙන ගොඩක් වැඩිහිටි පිරිස් ගොඩක් අමාරුවෙන් මෙම කර්මාන්තය කරගෙන යන්නෙ.

- අපේ අප්පච්චි නිතරම කියන්නේ මැටි බඳුවල උයන්න, වතුර බොන්න , එතකොට පිළිකා වගේ භයානක ලෙඩ හැදෙන්නේ නෑ කියලා. ඒක නිසා මෙම කර්මාන්තය ගැන දැන ගන්න එක ගොඩක් වැදගත් කියලා මට හිතෙනවා.

- මැටි වෙනුවට ප්ලාස්ටික්, ඇළුමිනියම්, බිලොක්ගල්, ඇස්බැස්ටස්, ටකරන් වැනි වෙනත් ආදේශක දේවල් වෙළඳපලට පැමිණීම නිසා මැටි කර්මාන්තයට බලපෑමක් එල්ල වෙලා තිබෙනවා.





- මැටි කර්මාන්තය ලංකාවට වටිනා සම්පතක්. ඒ නිසා එය දියුණු කරන්න අපේ රටේ නායකයින් උදව් කරන්න ඕනි.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරි වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN අංකය: 978-624-211-167-4